# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1640/31 - 2010 පෙබරවාරි 12 වැනි සිකුරාදා - 2010.02.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශය යටතේ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව සංස්ථාපනය කිරීම

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) වැනි අනු ව්‍යවස්ථාව යටතේ කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යවරයා යටතේ රැකියා නියුක්තිය ප්‍රවර්ධනය කිරීම, රැකියා සැලසුම්කරණය, රැකියා නියුක්තිය හා ශ්‍රම වෙළඳපොල තොරතුරු, වෘත්තීය මාර්ගෝපදේශ වැඩ සටහන්, යළි රැකියා නියුක්තිය සඳහා පුහුණු යන විෂයයන් නිශ්චය කර අංක 1482/9 සහ 2007 ජනවාරි 29 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් නිවේදනයට පත් කර ඇති හෙයින් සහ 2009 දෙසැම්බර් මස 26 වෙනි දින අමාත්‍ය මණ්ඩලය මගින් කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය ගරු ආතාවුද සෙනෙවිරත්න මැතිතුමා විසින් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව සංස්ථාපනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද 2009 අගෝස්තු මස 12 වැනි දින අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් අංක 09/1527/340/028 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට දෙන ලද අනුමැතිය ප්‍රකාරව කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශය යටතේ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 2010 ජනවාරි 01 දින සිට සංස්ථාපනය කළ බව මෙයින් සියළුම මහජනතාව වෙත නිවේදනය කරමි.

මේ වනතෙක් කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශයේ රැකීරක්ෂා අංශය මගින් ඉටුකරන ලද පහත සඳහන් විෂයයන්ට අදාල රාජකාරි කටයුතු -

ජාතික මිනිස්බල සහ රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම

රැකියා නිර්මාණය හා ප්‍රවර්ධන කටයුතු

වෘත්තීය මාර්ගෝපදේශනයට අයත් කටයුතු

ශ්‍රම වෙළෙඳපොල තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම

රැකියා පියස මගින් සිදුකෙරෙන සියලු සේවාවන්

සහ ඉහත විෂයයන්ට ආනුෂංගික සහ සම්බන්ධිත සෙසු සියලු කටයුතු 2010 ජනවාරි 01 දින සිට කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ සංස්ථාපනය කරන ලද මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් මගින් සිදුකරනු ලැබේ.

*ලිපිනය* : අධ්‍යක්ෂ ජනරාල්, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව,
නො 64, කෙළින් වීදිය, බත්තරමුල්ල.

මහින්ද මඩිහහේවා,
ලේකම්.

2010 පෙබරවාරි මස 10 වැනි දින,
කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය, කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.

02-730

1A - G 12435— 430 (2010/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.